**SAMODHANA JOURNAL**

Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale

**2021 Volume 10 Issue I**

# පාඬිග්ගම වන්නි වැදි ගම්මානය ආශ්‍රිත ව පවතින ඇදහිලි විශ්වාස පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**ආර්.ඩී.ඩී. පුෂ්ප කුමාර**[1]

Received Date: 06th July 2022
Accepted Date: 20th March 2023
Published Date: 06th June 2023

## Abstract

*Padiggama* Vanni Veddha village is in No.54 *Hirallugama Grama Niladhari* Division in Medawachchiya Divisional secretariat of Anuradhapura District. *Padiggama village* is extremely important in the discussion of Ethno archaeology. Ethno archaeology can be used in the reconstruction of ancient cultures. Therefore, research aims to conduct an Ethno archaeological study of *Padiggama* about ritual beliefs. Research is extensively conducted on the ritual beliefs of *Vanni Veddha* villages, but ritual beliefs in *Padiggama* village are not a widely researched topic. Therefore, another research aim of this study is to fill this research gap. The research problem of this study is to study how the beliefs of the *Vanni Veddha* village in *Padiggama* can be used to interpret the archaeological interpretations of Ethno archaeology. Both qualitative and quantitative data analysis methods were used for this research. Special research methods have to be used for Ethno archaeological studies. At first, primary and secondary sources of literature written about the *Vanni Veddha* people were consulted. After that, previous research into the ritual beliefs of *Vanni Veddha* villages was studied. After that, field visits were conducted.

---

[1] *පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව.* *dhanushkapushpakumara2069@gmail.com*

Participant observation had to be used in field visits because of ethno archaeological studies. The facts were studied by going to the places of ritual belief and adapting to their culture. There are some main ritual beliefs in *Padiggama* village. like that Deviyan *mayam weeme shanthikarmaya*, *pideni shanthiya*, worship *veddha kanda*, *woship of pullaar*. We can study how the young generation of *Padiggama* village accepts these religious beliefs a lot. They do not accept these religious beliefs. Therefore, researchers have to record these valuable Ethno archaeological factors. Moreover, valuable archaeological interpretations can be interpreted using ethno archaeology. Ethnoarchaeological researchers and other social groups should protect these valuable ritual beliefs for future generations.

**Keywords:** Archaeological interpretations, Ethno archaeology, Padiggama, Ritual beliefs, *Vanni Veddha*

## පර්යේෂණ සාරාංශය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 54 හිරල්ලුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටා ඇති පාඬිග්ගම වන්නි වැදි ගම්මානය මානවවංශ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගම්මානයකි. මානවවංශ පුරාවිද්‍යාවෙන් සිදු කෙරෙන්නේ, ප්‍රාථමික ජන කණ්ඩායම් ඇසුරින් අතීත ප්‍රාථමික සමාජය ප්‍රතිනිර්මාණය කිරීමයි. ඒ අනුව පාඬිග්ගම වන්නි වැදි ජනතාව ඇසුරින් අතීත ප්‍රාථමික වන්නි වැදි සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කිරීම සිදු කෙරේ. මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ, පාඬිග්ගම ගම්මානයේ පවතින ඇදහිලි විශ්වාස පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. වන්නි වැදි ගම්මානවල ඇදහිලි විශ්වාස පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී තිබුණ ද පාඬිග්ගම ඇදහිලි විශ්වාස පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී නොමැත. එබැවින් එම පර්යේෂණ රික්තය පූරණය කිරීම ද මෙම පර්යේෂණයේ අවශේෂ අරමුණකි. පර්යේෂණයේ ගැටලුව වන්නේ, පාඬිග්ගම වන්නි වැදි ගම්මානයේ ඇදහිලි විශ්වාස මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සඳහා ඉවහල් කරගන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරිමයි. පර්යේෂණ ක්‍රමවේදයේ දී ගුණාත්මක සහ සංඛ්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් පර්යේෂණ කාර්ය සිදු විය. පාඬිග්ගම ගම්මානය මානවවංශ පුරාවිද්‍යාත්මක ව වටිනාකමක් ඉසිලීම හේතුවෙන් පර්යේෂණය සඳහා මෙම මාතෘකාව තෝරා ගන්නා ලදී. ප්‍රථමයෙන් වන්නි වැදි ජනතාව පිළිබඳ ලියැවුණු ප්‍රාථමික සහ ද්වීතියික සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කළ අතර පසු ව වන්නි වැදි ගම්මාන සහ ඒවායේ ඇදහිලි විශ්වාස පිළිබඳ පූර්ව පර්යේෂණ අධ්‍යයනය කෙරිණි. මෙම පර්යේෂණය මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් බැවින් ක්ෂේත්‍ර අධ්‍යනයේ දී සම්මුඛ සාකච්ඡා

පැවැත්වීම, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය, පාඬිග්ගම ගම්මානයේ දින කිහිපයක් ජීවත් වීම ආදි සුවිශේෂී ක්‍රමවේද යොදා ගැනීමටට සිදු විය. එහි දී ඇදහිලි විශ්වාස සිදු කෙරෙන ස්ථානවලට ගොස් ඔවුන්ගේ සංස්කෘතියට අනුගත වෙමින් කරුණු අධ්‍යයනය කෙරිණි. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය, පිදේනි ශාන්තිය, වැද්දා කන්දට දානය දීම සහ පුල්ලෙයාර් වන්දනය ආදි ඇදහිලි විශ්වාස පිළිබඳ ව සාකච්ඡා කිරීමත් ඒවා ඇසුරින් පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කිරීමත් පර්යේෂණයේ දී සිදු කෙරිණි. පර්යේෂණයේ දී සිදු කළ මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සඳහා දඹාන ආශ්‍රිත මහා වැදි ප්‍රජාව ද යොදා ගැනීම සිදු විය. ඒ අනුව ප්‍රාථමික වන්නි වැදි සමාජය ප්‍රතිනිර්මාණය කිරීමටත්, පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කිරීමටත් පාඬිග්ගම ඇදහිලි විශ්වාස ඉවහල් වන බව නිගමනය කළ හැකි ය. පාඬිග්ගම තරුණ පරම්පරාව මෙම ඇදහිලි විශ්වාස පිළිබඳ එතරම් පිළිගැනීමක් හෝ ගෞරවයක් නොමැති බව පෙනී යයි. තව ද තරුණ පරම්පරාව ඔවුන්ගේ වැඩිහිටියන්ගෙන් තමාට උරුම වන සාම්ප්‍රදායික උරුමයන් පිළිබඳ ව සැලකිය යුතු තැකීමක් නොමැති බව පෙනී යයි. සමාජ නව්‍යකරණයත් සමඟ මෙය සිදු වේ. එබැවින් මෙම වටිනා උරුමය නිසි පරිදි වාර්තා කිරීම පර්යේෂකයන් අතින් ඉටු විය යුතු කාර්යභාරයක් වන අතර උරුමය ආරක්ෂා කර ගැනීම සමස්ත ප්‍රජාවගේ ම වගකීමකි.

**මූඛ්‍ය පද:** ඇදහිලි විශ්වාස, පාඬිග්ගම, පුරාවිද්‍යා අර්ථකථන, මානවවංශ පුරාවිද්‍යාව, වන්නි වැදි

## හැඳින්වීම (Introduction)

වර්තමාන ප්‍රාථමික ජන කොට්ඨාස යොදා ගෙන අතීත ප්‍රාථමික සමාජයන්හි සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කිරීමට (Reconstuction) මානවවංශ පුරාවිද්‍යාවෙන් විශාල පිටිවහලක් සැපයේ. තව ද ප්‍රාග් ඓතිහාසික සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කිරීමට පවා මානවවංශ පුරාවිද්‍යාවෙන් ලබා ගත හැකි පිටිවහල අනල්ප ය. ශ්‍රී ලංකාවේ වැදි ජනතාව සහ ප්‍රාග් මානවයා අතර ඇති සබඳතාව පිළිබඳ විද්‍යාත්මක ව පර්යේෂණ සිදු වී ඇත. නිදසුනක් ලෙස ඇමෙරිකාවේ කෝර්නල් විශ්වවිද්‍යාලයේ කෙනත් කෙනඩි විසින් සිදු කරන ලද ජාන විද්‍යාත්මක පර්යේෂණවලින් පෙනී ගියේ, දඹානේ වැදි ප්‍රජාව සහ මෙරට මධ්‍යශිලා යුගයේ ප්‍රාග් මානවයා අතර කිට්ටු සබඳතාවක් පවතින බවයි (දැරණියගල, 1992: 24). තත් පර්යේෂණවලට මානවවංශ පුරාවිද්‍යාව ද එක් වූ විට බහු විෂයාත්මක ව පුරාවිද්‍යාව අර්ථකථනය කිරීමේ හැකියාව පවතී. ඒ අනුව ප්‍රාථමික සමාජ ඇසුරින් වටිනා පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කළ හැකි බව තහවුරු වේ. තව ද මානවවංශ පුරාවිද්‍යාවේ දී සජීවී සමාජ සමඟ පර්යේෂණ සිදු කිරීම හේතුවෙන් මෙම විෂය ක්ෂේත්‍රය ජීවමාන පුරාවිද්‍යාව (Living Archaeology) ලෙස ද හැඳින්වේ (චන්ද්‍රරත්න, 2009: 35-40). මානවවංශ පුරාවිද්‍යාව අර්ථකථනය කිරීමේ දී මෙම අර්ථදැක්වීම අතිශය වැදගත් වේ. **මන්ද සජීවී**

**දත්ත පුරාවිද්‍යා අර්ථකථන සඳහා යොදා ගැනීම සුවිශේෂී සන්දර්භයක සාකච්ඡා කළ යුතු බැවිනි.**

ඒ අනුව මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ, පාඬිග්ගම ගම්මානයේ පවතින ඇදහිලි විශ්වාස පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. පර්යේෂණ අරමුණ පිළිබඳ සැලකිය යුතු පැහැදිලි කිරීමක් සිදු කිරීම මැනවි. මෙහි දී මූලික වශයෙන් සිදු කර ඇත්තේ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් වන අතර ඒ සඳහා පාඬිග්ගම නමැති වන්නි වැදි ගම්මානයේ දැකිය හැකි ප්‍රධාන ම ඇදහිලි විශ්වාස හතරක් යොදා ගෙන ඇත. එනම් දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය, පිදේනි ශාන්තිය, වැද්දා කන්දට දානය දීම සහ පුල්ලෙයාර් දේව වන්දනයයි. මේ සියලු ම ඇදහිලි විශ්වාස මානවවංශ පුරාවිද්‍යාත්මක න්‍යායයන් ආශ්‍රය කරගෙන අධ්‍යයනය කිරීම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණයි. තත් විෂය ක්ෂේත්‍රයේ ඇති පර්යේෂණ රික්තය පූරණය කිරීම පර්යේෂණයේ අවශේෂ අරමුණ වේ. වන්නි වැදි ජනතාව පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී ඇතත් පාඬිග්ගම වන්නි වැදි ජනතාව පිළිබඳ හෝ ඔවුන්ගේ ඇදහිලි විශ්වාස පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී නොමැත.


මානවවංශ පුරාවිද්‍යා අධ්‍යයනයක දී සුවිශේෂී ක්‍රමවේද කිහිපයක් යොදා ගැනීම සිදු කෙරේ. **මානවවංශ විද්‍යා උදාහරණ තර්කන ක්‍රියාවලිය (Ethnographic analogy) මානවවංශවිද්‍යා දත්ත සහ පුරාවිද්‍යාත්මක දත්ත තුලනාත්මක ව අධ්‍යයනය කිරීම (Comparative Study) ආදි සුවිශේෂී ක්‍රමවේද මෙහි දී යොදා ගැනේ. මේ සියලු ම ක්‍රමවේද යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. උක්ත ක්‍රමවේදවලින් සපයා ගත් දත්ත සියල්ල මැනවින් විශ්ලේෂණය කර පර්යේෂණ ගැටලුවේ සඳහන් වන ආකාරයට පාඬිග්ගම ඇදහිලි විශ්වාස යොදා ගෙන මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කරන ලදී.**

## පර්යේෂණ ක්‍රමවේදය (Materials and Methods)

මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක දී භාවිතයට ගැනෙන පර්යේෂණ ක්‍රමවේදය අනෙකුත් පුරාවිද්‍යාත්මක අධ්‍යයනවලට වඩා වෙනස් වේ. ඊට හේතු වන්නේ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයන් සජීවී මානව සමාජයන් සමඟ සිදු කිරීමයි. මෙම විෂය පථය ජීවමාන පුරාවිද්‍යාව (Living Archaeology) ලෙස හඳුන්වන බව ඉහත සඳහන් කර ඇත්තේ ද මේ නිසා ය. **කෙසේ වුවත් තත් පර්යේෂණයේ දී ගුණාත්මක (Qualitative) සහ ප්‍රමාණාත්මක (Quantitative) අධ්‍යයන ක්‍රමවේද භාවිතයට ගන්නා ලදී.** පර්යේෂණ කාර්යයේ දී ප්‍රථමයෙන් ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය සහ ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රය යොදාගෙන වැදි ජනතාව සහ වන්නි වැදි ජනතාව පිළිබඳ අධ්‍යයනය කෙරිණි. පූර්ව පර්යේෂණවලට අවධානය යොමු කිරීමේ දී පෙනී ගියේ වන්නි වැදි ජනතාව පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී ඇතත් පාඬිග්ගම පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැති බවයි. නමුත් මෙම

පර්යේෂණයේ දී අර්ථකථනවලට එළඹීමේ දී වන්නි වැදි ජනතාව පිළිබඳ සිදු කෙරුණු පූර්ව පර්යේෂණ මහත් පිටිවහලක් විය. **වන්නි වැදි ජනතාව පිළිබඳ සිදු කළ මුල් ම විධිමත් පර්යේෂණය වන්නේ, කුකුළෑව ගම්මානය පාදක කරගනිමින් ජේම්ස් බ්‍රෝ විසින් සම්පාදිත Vedda villages of Anradhapura: The Historical Anthropology of a community in sri lanka කෘතියයි** (Brow, 1978). එහෙත් ජේම්ස් බ්‍රෝගේ අධ්‍යයනය මානවවංශ පුරාවිද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් සිදු කළ අධ්‍යයනයක් නොවන බව මෙහි දී සඳහන් කිරීම යෙහෙකි. **එමෙන් ම මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් නොවුණ ද එඩ්මන්ඩ් ලීච් විසින් සම්පාදනය කරන ලද ‘පුල්එළිය’ කෘතිය ද පර්යේෂණ කාර්යයේ දී ඉවහල් වේ.** මීට අමතර ව ආචාර්ය දර්ශන බණ්ඩාර ඔහුගේ දර්ශනපති (M.Phil) උපාධිය සඳහා සම්පාදනය කළ උපාධි නිබන්ධය මේ අධ්‍යයනයේ දී අතිශය වැදගත් වේ. ඔහු විසින් වන්නි වැදි ගම්මානයක් වන කුංචුට්ටු කෝරළය මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. එම අධ්‍යයනය ද සෘජුව ම මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් නොවුණ ද ඉන් ලබා ගත හැකි ආභාසය නොමඳ ය.

ඉහත සඳහන් කළ ආකාරයට ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සුවිශේෂී ක්‍රමවේද භාවිතයට ගන්නා ලදී. **විශේෂයෙන් සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය (Participant Observation) ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී බහුල වශයෙන් භාවිතයට ගැනීමට සිදු විය. නිදසුනක් ලෙස 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වන දා රාත්‍රියේ පාඩිග්ගම පැවති කාලි මෑණියන්ට දානය දීමේ අවස්ථාව මේ ආකාරයට සහභාගීත්ව නිරීක්ෂණය යටතේ වාර්තා කළ අවස්ථාවකි. එහි දී රැය පහන් වන තෙක් එම ස්ථානයේ රැඳී සිටිමින් කාලි මෑණියන්ට දානය දීමේ අවස්ථාව වාර්තා කරන ලදී. එහි දී කාලි මෑණියන්ගේ දේවාලයේ කපු මහතා වන කේ. වික්‍රමපාල මහතා සහ පාඩිග්ගම මහවැවේ විදානේ මුතුබණ්ඩා මහතා සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ද සිදු කෙරිණි. මේ ආකාරයට ගම්මානයට ගොස් දින කිහිපයක් ගම්මානයේ නවාතැන් ගෙන ගම්වැසියන්ගේ සංස්කෘතියට අනුගත වෙමින් මෙම ශාන්තිකර්ම, පුද පූජා නිරීක්ෂණය කරන ලදී. එහි දී ඡායාරූපකරණය, වීඩියෝ පටිගත කිරීම වැනි ක්‍රමවේද ද භාවිතයට ගැනිණි.**




වගු සටහන් 01

## ප්‍රතිඵල (Results)

මෙහි දී පාඬිග්ගම ප්‍රධාන ඇදහිලි විශ්වාස පිළිබඳ ව කරුණු දක්වීම සිදු වන අතර දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය, පිදේනි ශාන්තිය, වැද්දා කන්දට දානය ලබා දීම සහ පුල්ලෙයාර් වන්දනය පිළිබඳ සාකච්ඡා කෙරේ.

- **දෙවියන් මායම්වීමේ ශාන්ති කර්මය**

පාඬිග්ගම දැකිය හැකි ශාන්තිකර්ම අතර ඇති වැදගත් ම ශාන්තිකර්මය වන්නේ, දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය යි. මෙම ශාන්තිකර්මය පොදුවේ නුවර කලාවියේ මෙන් ම වන්නි වැදි ගම්මානවල ද දැකිය හැකි ය. එහෙත් ස්ථානීය පිහිටීම අනුව පාඬිග්ගම දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ ඊට ම අනන්‍ය වූ ලක්ෂණ විශද වේ. මෙකී නොකී සියලු ම කාරණා හේතුවෙන් පාඬිග්ගම දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය ඉහළ වැදගත්කමකින් යුතු වේ. **එමෙන් ම කුකුළෑව, රඹකැපුවැව, කුංචුට්ටු කෝරළය වැනි වෙනත් වන්නි වැදි ගම්මානයක දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයක් පැවැත්වීමේ දී එහි මූලිකත්වය ගනු ලබන්නේ ද පාඬිග්ගම වැසියන් විසිනි** (සම්මුඛ සාකච්ඡා: කදිරාන මහතා සමඟ පුෂ්ප කුමාර, 2020.02.18). පාඬිග්ගම දෙවියන් මායම් වීමේ ශාන්තිකර්මයේ අනන්‍යතාව ඉස්මතු කිරීමට එම කරුණ වුව ද ප්‍රමාණවත් වේ. **තත් ශාන්තිකර්මය වැදගත් වීමට තවත් සුවිශේෂී කරුණක් බලපා ඇත. එනම් එහි ඇති මනෝචිකිත්සාත්මක වටිනාකමයි. ආතුරයාගේ සිතෙහි පවතින අදෘශ්‍යමාන බලවේගය පිළිබඳ පවතින බිය පහ ව ගොස් මානසික චිකිත්සාවක් ලබා දීම මෙම ශාන්තිකර්මයෙන් සිදු කෙරේ. ශාන්තිකර්මය සඳහා යොදා ගන්නා දේව ආභරණ කට්ටලය හේතුවෙන් මෙම**

**මානසික චිකිත්සාව තීව්‍ර වේ.** මෙම දේව ආභරණ කට්ටලය වන්නි වැදි ජනතාවගේ අනන්‍යතාව ප්‍රකට කෙරෙන ආභරණ කට්ටලයකි. මන්ද මෙම ආභරණ සියල්ල සැකසී ඇත්තේ වන්නියට අධිගෘහීත දෙවිවරුන්ගේ ආයුධවලිනි. නිදසුන් ලෙස,

- **නයි හත්ත**
- **ජම ජාරිය**
- **කාල ජමජාරිය**
- **සීරි කඩුව**
- **හෝල් කෝටුව** දැක්විය හැකි ය (ඡායාරූපය 01, 02, 03, 04).

මෙම ආභරණ කතරගම, හඳුන් කුමාර, කඩවර, සළඹකුමාර, ඉලන්දාරි හත්කට්ටුවේ දෙවිවරු ආදි දෙවිවරුන්ට අයත් ආයුධ වේ. මෙම ආයුධ යොදා ගැනීමෙන් ආතුරයාගේ මානසික විශ්වාසය ගොඩනැඟී අමනුෂ්‍ය බලවේගය සුවපත් වීමට හේතු වේ. ශාන්තිකර්මයේ ක්‍රියාවලිය මෙසේ ය.

ශාන්තිකර්මය ආරම්භ වීමට ප්‍රථමයෙන් යහන් තනා, ගොටු පූජා කර, දෙවියන්ට කවි ගායනා කර දෙවියන්ට ආරාධනා කිරීම සිදු වේ. ඉන් පසු ව යකැදුරා ශාන්තිකර්මය ආරම්භ කරයි. **මේ අවස්ථාවේ යකැදුරා වන්නියට අධිගෘහීත දෙවිවරුන්ගේ ආයුධ කට්ටලයක් පැළඳගෙන ශාන්තිකර්මයට අවතීර්ණ වෙයි.** මේ අවස්ථාවේ දී ආතුරයාට ආවේශ වී ඇති අමනුෂ්‍ය බලවේගයට වඩා බලවත් දෙවි කෙනෙකු යකැදුරාට ආවේශ වන අතර ඉන් ආතුරයාගේ සිතේ ඇති වන විශ්වාසය ඔස්සේ මානසික චිකිත්සාවක් ඇති වේ.

- **පිදේනි ශාන්තිය**

**පිදේනි ශාන්තිය සිදු කෙරෙන්නේ, ලෙඩ දුක් සහ අමනුෂ්‍ය බලවේග තුරන් වීම සඳහා ය. පිදේනි ශාන්තිය සිදු කෙරෙන අනුපිළිවෙළක් පවතී. පිදේනි ශාන්තිය පොදුවේ සෑම වන්නි වැදි ගම්මානයක ම මෙන් ම නුවර කලාවියේ ගම්මානවල ද දැකිය හැකි ශාන්තිකර්මයකි. පාඬිග්ගම පිදේනි ශාන්තිය සඳහා නුවර කලාවියේ ආභාසය ලැබී ඇති අතර අවශේෂ වන්නි වැදි ගම්මානවල ආභාසය ද ලැබී ඇත. එහෙත් කාලාන්තරයක් තිස්සේ පාඬිග්ගම ගම්මානයේ මෙම ශාන්තිකර්මය පැවතීම නිසා ගම්මානයට ම ආවේණික වූ ලක්ෂණ ද පවතී. පාඬිග්ගම ගම්මානයේ පිදේනි ශාන්තිය පහත අවස්ථාවලින් යුක්ත වේ.**

- ❖ **පිදේනි දීම**
- ❖ **යහන් දීම**
- ❖ **දෙවියන්ට යාදිනි කීම**
- ❖ **මතුරා දිශ්ටි ගැනීම**
- ❖ **සමයං කිරීම**

මේ ආකරයට පිදේනි ශාන්තිය සිදු කෙරේ. ශාන්තිකර්මය අවසානයේ ආතුරයාට යහපත් මානසික තත්ත්වයක් ඇති වේ.

- **වැද්දා කන්දට දානය දීම**

**වෙනත් වන්නි වැදි ගම්මාන සමඟ සංසන්දනය කිරීමේ දී පාඬිග්ගම ගම්මානය වෙත සුවිශේෂී ස්ථානයක් හිමි වේ. වන්නි වැදි සංස්කෘතියේ අනන්‍යතාව ඉස්මතු කළ හැකි ප්‍රබල සාධක පාඬිග්ගම ඇදහිලි විශ්වාස අතර පවතී. වැද්දා කන්දට දානය දීමේ ඇදහිල්ල ද ඒ ආකාරයේ සුවිශේෂී ඇදහිල්ලකි. මෙම ඇදහිල්ල දැකිය හැකි වන්නේ පාඬිග්ගම පමණක් වීම වෙසෙසින් සාකච්ඡා කළ යුතු කරුණකි. වැද්දා කන්ද ප්‍රකට ව ඇත්තේ මළගිය ඥාතීන්ට පුදපූජා කරන ස්ථානයක් වශයෙන් වුව ද ඒ ආශ්‍රිත ව දඩයම ද සිදු වී ඇත. වර්තමානයේ පාඬිග්ගම ආශ්‍රිත ව දඩයම විශාල වශයෙන් දැකිය නොහැකි වුව ද අතීතයේ පැවතිණි. මේ අනුව පෙනී යන්නේ වැද්දා කන්ද සංස්කෘතීන් කිහිපයක් නියෝජනය කරන ස්ථානයක් බවයි. පර්යේෂණ ගැටලුව අනුව යමින් මේ ස්ථානය මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සඳහා ඉවහල් වන ආකාරය පරීක්ෂා බැලිය යුතු ය. එහි දී දිවයිනේ මහා වැදි සම්ප්‍රදායේ ඇදහිලි විශ්වාස පිළිබඳ අධ්‍යයනය කිරීමට සිදු වේ. නෑ යකුන් පිදීමේ චාරිත්‍රය දඹාන ආශ්‍රිත වැදි සංස්කෘතියේ මෙන් ම අවශේෂ වැදි සංස්කෘතිවල ද චිරප්‍රකට ඇදහිල්ලකි.** පාඬිග්ගම වැද්දා කන්දට දානය දීමේ ඇදහිල්ල නෑ යකුන් පිදීමේ චාරිත්‍රයට සාම්‍ය වීම මෙහි මානවවංශ පුරාවිද්‍යාත්මක අගය තිව්‍ර කරයි. වැද්දා කන්දට දානය දීමේ ඇදහිල්ලේ දී සිදු වන්නේ, පාඬිග්ගම මිය ගිය ඥාතීන් වෙත කෘතගුණ දැක්වීමයි. ස්වකීය ඥාතීන් මිය යෑමෙන් පසු ව වැද්දා කන්ද ආශ්‍රිත ව නැවත උපදින බවට පාඬිග්ගම වැසියෝ විශ්වාස කරති (සම්මුඛ සාකච්ඡා: මුතුබණ්ඩා මහතා සමඟ පුෂ්ප කුමාර, 2021.10.17). දඹාන, සීතල වන්නිය සහ බණ්ඩාරදූව ආදි ප්‍රදේශවල වැදි ජනතාව පුද්ගලයෙකු මිය ගිය පසු ඔහු කන්දෙ යකා සමීපයට යන බව විශ්වාස කරති. නෑ යකුන් පිදීමේ චාරිත්‍රය නමින් ප්‍රකට මෙම චාරිත්‍රයේ දී මළගිය ඥාතීන් යළි යළිත් සිහිපත් කිරීමක් දැකිය හැකි ය (රණසිංහ, 2009: 330). වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය පිළිබඳ අධ්‍යයනය කිරීමට වුව ද මෙම ඇදහිලි ප්‍රබල වශයෙන් හේතු වේ. වන්නි වැදි ජනතාව, දඹාන ආශ්‍රිත වැදි සංස්කෘතියේ මූලයන් සහිත ජන කොට්ඨාසයක් බවට උපකල්පනය කිරීමේ දී එම උපකල්පනය සනාථ කිරීමට මෙවැනි කාරණා පර්යේෂණ මූලයන් ලෙස යොදා ගත හැකි ය.

**පුල්ලෙයාර් දේව වන්දනය**

වන්නි වැදි ගම්මානවල පුල්ලෙයාර් වන්දනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී හින්දු ආභාසය පිළිබඳ සාකච්ඡා කිරීම අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුතු ය. **පාඬිග්ගම මතු නො ව වෙනත් වන්නි වැදි ගම්මානවල ද හින්දු සංස්කෘතිය දැකිය හැකි ය. වන්නි වැදි ගම්මානවලට හින්දු සංස්කෘතියේ ආභාසය ලැබෙන්නට හේතු කිහිපයක් බලපා**

**ඇත. ඒ අතරින් ආසන්න ම හේතුව වන්නේ වන්නි වැදි ගම්මානවල පිහිටීමයි. එනම් බොහෝ වන්නි වැදි ගම්මාන පිහිටා ඇත්තේ, දමිළ ජනතාව වාසය කරන ජනාවාස ආශ්‍රය කරගෙනයි. නිදසුනක් ලෙස මැදවච්චිය, කැබිතිගොල්ලෑව, වව්නියාව ආදි ප්‍රදේශවල වන්නි වැදි ජනතාව දමිළ ජනාවාස ආශ්‍රිත ව ජීවත් වෙති. මේ හේතුවෙන් දමිළ සංස්කෘතියේ ඇතැම් සංස්කෘතිකාංග වන්නි වැදි ගම්මාන වෙත සම්ප්‍රේෂණය වී ඇත.**

පුල්ලෙයාර් වන්දනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී භූගෝලීය වශයෙන් පවතින ආසන්නතාව මෙන් ම වන්නි වැදි ජනතාවගේ ජනශ්‍රැතියේ එන කතාන්දර ද වැදගත් වේ. පුල්ලෙයාර් දෙවියන් වන්නි වැදි ජනතාව සමග සම්බන්ධ වන්නේ, වල්ලි අම්මා හේතුවෙනි. වල්ලි අම්මා යනු කතරගම දෙවියන්ගේ බිරිඳක බව අපි දනිමු. ඇය වන්නි වැදි කන්තාවක යැයි පාඬිග්ගම ඇතුළු වන්නි වැදි ගම්මානවල වෙසෙන ජනතාව විශ්වාස කරති (සම්මුඛ සාකච්ඡා: කදිරාතා මහතා සමග පුෂ්ප කුමාර, 2020.02.18). **කතරගම දෙවියන් සහ වල්ලි අම්මා අතර පැවති ආදර සම්බන්ධතාවට පුල්ලෙයාර් දෙවියන් උදවු කළ බව වන්නි වැදි ජනතාවගේ ජනශ්‍රැතිවල සඳහන් වේ** (බෝහිංගමුව සහ සිරිවර්ධන , 2010: 337-357). මේ සියලු ම කරුණු කාරණා පරීක්ෂා කිරීමේ දී පුල්ලෙයාර් දෙවියන් සහ වන්නි වැදි ජනතාව අතර සමීප සම්බන්ධතාවක් පවතින බව පෙනී යයි.

වන්නි වැදි ගම්මානවල පුල්ලෙයාර් දෙවියන් පිළිබඳ ගොඩනැඟී ඇති මෙම පසුබිම හේතුවෙන් දෙවියන් කෙරෙහි වන්නි වැදි ජනතාවගේ ඉමහත් ගෞරවයක් පවතී. පාඬිග්ගම ගම්මානයේ වුව ද සෑම නිවසක ම පුල්ලෙයාර් වන්දනය සඳහා ස්ථානයක් වෙන් කර ඇත (ඡායාරූපය 06). තව ද මහවැව, කුඩාවැව, ඉඳිගහ වැව සහ තල්ගහ වැව ආදි වශයෙන් පාඬිග්ගම ප්‍රධාන වැව් හතරක් ඇත. මේ වැව් හතර ම ආශ්‍රය කරගෙන පුල්ලෙයාර් වන්දනය සිදු වේ. අස්වැන්න නෙළන සමයේ වැව ආශ්‍රිත ව ඇති දේව සංහිඳේ පුල්ලෙයාර් දෙවියන්ට පුද පූජා පැවැත්වීම සිදු වේ (ඡායාරූපය 05). සිංහල අලුත් අවුරුද්දට පෙර අස්වැන්න ගෙට ගැනීම සිදු වන අතර එම සමයේ වැව් හතර ම ආශ්‍රිත ව උක්ත පුද පූජා පැවැත්වේ. මේ සඳහා වැව් සතර භාර ව කටයුතු කරන වැව් විදානේවරු ප්‍රමුඛ ව කටයුතු කරති. මේ ආකාරයට පාඬිග්ගම ගම්මානයේ පුල්ලෙයාර් වන්දනය ඉහළ වන්දනයට පාත්‍ර වේ.

## සාකච්ඡාව (Discussion)

පාඬිග්ගම ඇදහිලි විශ්වාස පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක ව අධ්‍යයනය කළ මෙම පර්යේෂණයේ දී සොයා ගත් දත්ත ගැඹුරින් සාකච්ඡා කිරීම මෙම කොටසේ දී අපේක්ෂා කෙරේ. පර්යේෂණ අරමුණ, අනු අරමුණ, පර්යේෂණ ගැටලුව සහ පර්යේෂණ ක්‍රමවේදය අනුව යමින් තෝරා ගත් ඇදහිලි විශ්වාස මෙහි දී ගැඹුරින් විශ්ලේෂණය කිරීම සිදු වේ. ඊට ප්‍රථම ව සුවිශේෂී කරුණක් සඳහන් කළ යුතු ය. එනම් මෙම පර්යේෂණයේ දී සාකච්ඡා කළ ඇතැම් ඇදහිලි විශ්වාස පාඬිග්ගමට

අනන්‍ය ඇදහිලි විශ්වාස වන අතර ඇතැම් ඇදහිලි විශ්වාස පොදුවේ වන්නි වැදි ගම්මානවල මෙන් ම පොදුවේ නුවර කලාවියේ ද දැකිය හැකි ය. ඒ කෙසේ වුවත් මේ සෑම ඇදහිලි විශ්වාසයක ම පාඬිග්ගමට අනන්‍ය ලක්ෂණ පවතී. භූගෝලීය පිහිටීම ගත් විට පාඬිග්ගම පොදු සමාජයෙන් තරමක් විනිර්මුක්ත ව පිහිටා ඇත. කුල භේදය නමැති කාරණය මේ සඳහා හේතු වී ඇත. මේ කරුණ ඔස්සේ පාඬිග්ගම ප්‍රජාවගේ සමාජ, සංස්කෘතික හැසිරීම පිළිබඳ යම් ඉඟියක් ද සපයා ගත හැකි ය. එහෙත් වර්තමානය වන විට මේ තත්ත්වය බොහෝ දුරට වෙනස් වී ඇතත් කාලාන්තරයක් තිස්සේ පැවති හුදෙකලා බව සමඟ පාඬිග්ගම සංස්කෘතික අංගවල ඊට ම ආවේණික ලක්ෂණ ගැබ් වී ඇත.

ප්‍රථමයෙන් ම දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය පිළිබඳ සාකච්ඡා කිරීම සිදු වේ. ප්‍රතිඵල කොටසේ දක්වා ඇති පරිදි මෙම ශාන්තිකර්මය අංශ ගණනාවකින් වැදගත් වේ. එබැවින් මෙම ශාන්තිකර්මය විධිමත් ව වාර්තා කිරීම අත්‍යවශ්‍යයෙන් ම සිදු විය යුතු ය. පර්යේෂණ අරමුණේ දක්වා ඇති පරිදි දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය මානවවංශ පුරාවිද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම මෙහි දී වැදගත් වේ. ඉහත සඳහන් කර ඇති ආකාරයට මානවවංශ පුරාවිද්‍යාවෙන් සිදු කෙරෙන්නේ අතීත ප්‍රාථමික මානව සමාජ ප්‍රතිනිර්මාණය කිරීමයි. ඒ අනුව වර්තමානයේ පාඬිග්ගම ආශ්‍රිත ව පවතින දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය පාදක කරගෙන අතීත වන්නි වැදි සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කළ හැකි ය. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ දී දේව ආභරණ කට්ටලයක් භාවිත කෙරෙන බව ඉහත දක්වා ඇත. තත් දේව ආභරණ කට්ටලය වන්නියට අධිගෘහීත දෙවිවරුන්ට අයත් ආයුධ කට්ටලයකි. ඒ ඔස්සේ අතීත වන්නි වැදි ජනතාවගේ ආගමික විශ්වාස, දේව විශ්වාස ආදි බොහෝ දේවල් ප්‍රතිනිර්මාණය කළ හැකි ය. මෙම ශාන්තිකර්මය, පර්යේෂණ අනු අරමුණ සමඟ ගෙන සාකච්ඡා කිරීමේ දී අනු අරමුණ සාක්ෂාත් වී ඇති බව පෙනී යයි. මන්ද නුවරකලාවියේ ඇදහිලි විශ්වාස පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී ඇතත් පාඬිග්ගම සහ වෙනත් වන්නි වැදි ගම්මානවල අන්තර්ගත දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී නොමැත.

තව ද දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය පිළිබඳ කරුණු වාර්තා කිරීමට සුවිශේෂී ක්‍රමවේද භාවිතයට ගැනීමට සිදු විය. ඒ අතර සහභාගීත්ව නිරීක්ෂණය **(Participant Observation)** වැදගත් වේ. එහි දී ගම්මානයේ දෙවියන් මායම්වීමේ ශාන්තිකර්ම පවත්වන ස්ථාන වෙත ගොස් ශාන්තිකර්ම පැවැත්වෙන ආකාරය නිරීක්ෂණය කරන ලදී. ඊට ප්‍රථම ව ගම්මානයේ ජ්‍යෙෂ්ඨ ම පුද්ගලයා වන කදිරාතා මහතා, මහවැවේ වැව් විදානේ මුතුබණ්ඩා මහතා සහ ශාන්තිකර්ම සිදු කරන කන්දාතගේ නන්දසේන මහතා යන ගම්වැසියන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සිදු විය (ඡායාරූප 07). ඔවුන්ගෙන් ලබා ගත් තොරතුරු විධිමත් ව වාර්තා කර ගැනීමෙන් පසු ව සහභාගීත්ව නිරීක්ෂණය **(Participant Observation)** යටතේ ශාන්තිකර්ම පැවැත්වෙන ස්ථාන වෙත ගොස් ශාන්තිකර්ම පටිගත කර ගැනීම සහ කරුණු වාර්තා කිරීම සිදු කරන

ලදී. එමෙන් ම දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ දී ගායනා කෙරෙන කවි ස්තෝත්‍ර ආදිය වාර්තාගත කෙරිණි.

දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය උරුම සන්දර්භය අනුව ද සාකච්ඡා කිරීම වැදගත් ය. පුරාවිද්‍යා විෂය සන්දර්භයේ දී උරුමය අංශ දෙකක් යටතේ සාකච්ඡා කෙරේ.

- **ස්පර්ශනීය උරුමය (Tangible Heritage)**
- **අස්පර්ශනීය උරුමය (Intangible Heritage)**

මේ අතරින් අස්පර්ශනීය උරුමය පිළිබඳ ලෝකයේ සාකච්ඡා කිරීම ආරම්භ වන්නේ 2003 සිටයි. 2003 දී **අස්පර්ශිත උරුමයන්** (Intangible Heritage) පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සකස් කෙරිණි. අස්පර්ශිත උරුමයන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි (Convention for the Safeguarding of the Intangible Cultural Heritage) අස්පර්ශිත උරුමය මෙසේ අර්ථකථනය කර ඇත.

**"The 'intangible cultural heritage' means the practices, representations, expressions, knowledge, skills – as well as the instruments, objects, artefacts and cultural spaces associated therewith – that communities, groups and, in some cases, individuals recognize as part of their cultural heritage. This intangible cultural heritage, transmitted from generation to generation, is constantly recreated by communities and groups in response to their environment, their interaction with nature and their history, and provides them with a sense of identity and continuity, thus promoting respect for cultural diversity and human creativity."** (Convention for the Safeguarding of the Intangible Cultural Heritage, Article 02, 2003).

මේ අනුව දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ ඇති අස්පර්ශනීය උරුමයන් විශ්ලේෂණය කිරීම සහ ඒවා සංරක්ෂණය කිරීම සිදු කළ හැකි ය. විශේෂයෙන් මෙම ශාන්තිකර්මයේ අන්තර්ගත මනෝචිකිත්සමය ස්වභාවය (Psychological and Therapeutic Ritual), ශාන්තිකර්මයේ අන්තර්ගත කවි ශ්ලෝක සහ ශාන්තිකර්මය හා බැඳුණු ජන විශ්වාස ආදිය අස්පර්ශනීය උරුමයන් ලෙස අර්ථකථනය කළ හැකි අතර ඒවා මතු පරපුර වෙත සංරක්ෂණය කළ යුතු ය.

තව ද දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය වන්නි වැදි ගම්මානවල වෙනත් ශාන්තිකර්මවලට වඩා වෙනස් වන්නේ මේ ඔස්සේ මනෝචිකිත්සාවක් ලබා දීම නිසා ය. මෙහි දී සිදු වන්නේ ආතුරයාට ආවේශ වී ඇති අමනුෂ්‍ය ආත්මයට වඩා බලවත් දේව ආත්මයක් යකැදුරාට ආවේශ වීමයි. එහි දී ආතුරාගේ සිතේ විශ්වාසයක් ගොඩනැගේ. තව ද දේව අනාභරණ කට්ටලය හේතුවෙන් මේ විශ්වාසය තීව්‍ර වේ. සාමාන්‍යයෙන් සිංහල සංස්කෘතිය තුළ කාලාන්තරයක් තිස්සේ ගොඩනැගුණු විශ්වාස පවතී. ඒ අතර දෙවියන් සහ අමනුෂ්‍යයන් පිළිබඳ ව ද එවැනි විශ්වාස පවතී. සිංහල සංස්කෘතිය තුළ කාලාන්තරයක් තිස්සේ ගොඩනැගුණු දෘෂ්ටිවාදය

(Ideology) වන්නේ, දෙවියන් අමනුෂ්‍යයන්ට වඩා යහපත් සහ බලවත් බවයි. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ දී භාවිතයට ගැනෙන්නේ මෙකී සිංහල සංස්කෘතිය තුළ කාලාන්තරයක් තිස්සේ ගොඩනැගුණු දෘෂ්ටිවාදයයි. ආතුරයාගේ සිතේ මානසික චිකිත්සාව ඇති වන්නේ ද මෙම දෘෂ්ටිවාදය හේතු කරගෙනයි.

වැද්දා කන්දට දානය දීමේ ඇදහිල්ල පිළිබඳ ව මීළඟට සාකච්ඡා කෙරේ. ප්‍රතිඵල කොටසේ දක්වා ඇති පරිදි මෙම ඇදහිල්ල පාඬිග්ගම ගම්මානයට සුවිශේෂී වන ඇදහිල්ලකි. එමතු නො ව මෙම ඇදහිල්ල හේතුවෙන් වන්නි වැදි සංස්කෘතිය සහ දඹානේ මහා වැදි සංස්කෘතිය අතර ඇති සාම්‍ය ද විග්‍රහ කළ හැකි ය. මේ නිසා වැද්දා කන්දට දානය දීමේ ඇදහිල්ල අංශ ගණනාවකින් වැදගත් වේ. පර්යේෂණ ගැටලුවේ දක්වා ඇති ආකාරයට වැද්දා කන්දට දානය දීම යන ඇදහිල්ල යොදා ගෙන වටිනා මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කළ හැකි ය. විශේෂයෙන් ම ඉහත සඳහන් කළ ආකාරයට දඹාන සහ වන්නි වැදි සංස්කෘතිය අතර ඇති සම්බන්ධතාව මෙහි දී අර්ථකථනය කළ හැකි ය. පාඬිග්ගම වැද්දා කන්ද ආශ්‍රිත ව මළවුන් විෂයෙහි ලා සිදු කෙරෙන කෘතගුණ දැක්වීමක් සිදු වේ. දඹානේ නෑ යකුන් පිදීමේ චාරිත්‍රයේ ද සිදු වන්නේ ස්වකීය මළගිය ඥාතීන් වෙත පුදපූජා කිරීමයි. ඒ අනුව පාඬිග්ගම වැද්දා කන්දට දානය දීමේ චාරිත්‍රය සහ දඹානේ කන්දෙ යකා ඇදහීමේ චාරිත්‍රය අතර යම් සාම්‍යයක් පවතී. මේ සාධකය යොදා ගෙන වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය පිළිබඳ ව මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කිරීමේ අවකාශය ද පවතී. පාඬිග්ගම ගම්මානයේ ජ්‍යෙෂ්ඨ ම ගම්වැසියා වන කදිරාතා මහතා සඳහන් කරන ආකාරයට පාඬිග්ගම වන්නි වැදි ජනතාව දඹානේ ආදිවාසීන්ගෙන් වෙන් වී පැමිණි ජන පිරිසකි (සම්මුඛ සාකච්ඡා: කදිරාතා මහතා සමඟ පුෂ්ප කුමාර, 2020.02.18). කදිරාතා මහතා සඳහන් කරන ආකාරයට දඹානේ ආදිවාසීන් පිරිසක් ශ්‍රී මහා බෝධියේ දරමිටි පෙරහැරට පැමිණ ඇත. ආදිවාසී ජන කණ්ඩායමෙන් කොටසක් අතරමං වී ඇති අතර එම පිරිස පාඬිග්ගමට පැමිණ ජනාවාස ආරම්භ කර ඇත (සම්මුඛ සාකච්ඡා: කදිරාතා මහතා සමඟ පුෂ්ප කුමාර, 2020.02.18). මෙම පාඬිග්ගම ජනශ්‍රැතිය පිළිබඳ තත් පර්යේෂණයේ කතුවරයා විසින් ආදිවාසී නායක උරුවරිගේ වන්නියලැත්තන්ගෙන් විමසන ලදී (ඡායාරූපය 08) එතුමාගේ පැහැදිලි කිරීම මෙසේ ය,

**"ආදිවාසි පරම්පරාව කියල කතා දම්මට ඒ පරම්පරාව හැම එකක්ම එකමයි. හැබැයි ගම්පොජ්ජවල්වලදී වෙනස් තැන මන්දො වෙනවා. භාෂාව වෙනස් තැන මන්දො වෙනවා. සිරිත් විරිත් වෙනස් තැන මන්දො වෙනවා. ඒ කොහොම වෙනස් වුන මන්දො වුනත් ඒ හැම එකක්ම එකමට එකමක් සම්බන්ධ වෙන මන්දො වෙනවා"**

උක්ත ප්‍රකාශයේ මූලික අදහස: (ආදිවාසී පරම්පරා විවිධ ගම්මානවල ජීවත් වීමේ දී වෙනස්කම් ඇතිවෙනවා. භාෂාව අතින්, සිරිත්විරිත් අතින් වෙනස්කම් ඇති වෙනවා. එහෙත් ආදිවාසී ජන කොට්ඨාස සියල්ල ම එකිනෙකට සම්බන්ධයි.)

(සම්මුඛ සාකච්ඡා: ආදිවාසී නායක උරුවරිගේ වන්නියලැත්තන් සමඟ පුෂ්ප කුමාර, 2022.02.03).

මේ ආකාරයට දඹාන සහ වන්නි වැදි සංස්කෘතිය අතර කිට්ටු සබඳතාවක් ඇති බව පෙනී යයි. ඒ සබඳතාවය මානවවංශ පුරාවිද්‍යාත්මක ව තහවුරු කිරීමට වැද්දා කන්දට දානය දීමේ ඇදහිල්ල ඉවහල් වේ.

මීළඟට පුල්ලෙයාර් වන්දනය පිළිබඳ සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රතිඵල කොටසේ දී සාකච්ඡා කළ පරිදි පුල්ලෙයාර් වන්දනය පොදුවේ නුවරකලාවියේ මෙන් ම වන්නි වැදි ගම්මානවල ද දැකිය හැකි ය. පුල්ලෙයාර් වන්දනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී නිසැක වශයෙන් වන්නි වැදි ගම්මානවල පවතින හින්දු ආභාසය පිළිබඳ සාකච්ඡා කළ යුතු ය. භූගෝලීය පිහිටීම අනුව පාඬිග්ගම ඇතුළු වන්නි වැදි ගම්මාන ද්‍රවිඩ ජනාවාස ආශ්‍රිත ව පිහිටා ඇත. වන්නි වැදි ගම්මානවල නාමකරණය වීමේ දී ද මෙම හින්දු බලපෑම ලැබී ඇති බව පෙනී යයි. නිදසුනක් ලෙස 'කුංචුට්ටුකෝරළය' නමැති වන්නි වැදි ගම්මානයේ නාමකරණය සැකසීමේ දී ද්‍රවිඩ ආභසයක් ලැබී ඇති බව වචනයේ ශබ්දාර්ථය විමසීමේ දී පෙනී යයි. මේ කාරණය ද සිහි තබාගෙන පුල්ලෙයාර් වන්දනය පිළිබඳ සාකච්ඡා කිරීම යෙහෙකි.

ගණපති, විනයසාර්, ගජකරණාදන් ආදි විවිධ නම්වලින් හැඳින්වෙන පුල්ලෙයාර් දෙවි ශ්‍රී ලාංකේය දේව සංස්කෘතියේ සුවිශේෂ දේව සංකල්පයකි. පුල්ලෙයාර් දේව සංකල්පය නුවර කලාවියට වැදගත් වීමට හේතු කිහිපයක් පවතී. ප්‍රධාන වශයෙන් කෘෂි ආර්ථිකයක් සහිත නුවරකලාවියට පුල්ලෙයාර් දෙවියන්ගේ ආශීර්වාදය බොහෝ වැදගත් වේ. වන්නි වැදි ගම්මානවල ජනතාවට පුල්ලෙයාර් දෙවියන් වැදගත් වීමට සුවිශේෂී කරුණක් ඇත. ඉහත දක්වා ඇති පරිදි වල්ලිඅම්මා හා බැඳුණු කථා ප්‍රවෘත්තියක් ඒ සඳහා හේතු වේ. මේ සියලු ම කාරණා හේතුවෙන් වන්නි වැදි ජනතාවට පුල්ලෙයාර් දෙවියෝ වැදගත් වෙති. පාඬිග්ගම ජනතාව වසරේ සෑම කාලයක ම කෘෂි කර්මාන්තයේ නියැළෙති. ඊට සරිලන පාරිසරික පසුබිමක් පාඬිග්ගම සැකසී තිබේ. කෘෂිකාර්මික කටයුතු සාර්ථක ව අවසන් කර ගැනීමට අවකාශය සකසා දෙන මෙන් පාඬිග්ගම වැසියන් පුල්ලෙයාර් දෙවියන්ට භාර වීම සුලබ දෙයකි (සම්මුඛ සාකච්ඡා: කන්දාතගේ නන්දසේන මහතා සමඟ පුෂ්ප කුමාර, 2021.10.17). පාඬිග්ගම ජනතාව කුමන සුබ කටයුත්තක් ආරම්භ කිරීමට වුව ද පූර්වයෙන් පුල්ලෙයාර් දෙවියන්ට යාතිකා කිරීම සිදු කරති. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ දී සඳහන් කළ ආකාරයට එහි දී ද මනෝ චිකිත්සමය ස්වභාවයක් ඇති වේ. එනම් පුල්ලෙයාර් දෙවියන් නිසා ස්වකීය කාර්ය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වන බවට විශ්වාසයක් ගොඩනැගේ.

පාඬිග්ගම සංස්කෘතිය සමඟ අත්‍යන්තයෙන් ම බැඳී ඇති වැදගත් අංශයක් වන්නේ වාරි පද්ධතියයි. අනෙකුත් වන්නි වැදි ගම්මානවලට වඩා පාඬිග්ගම ආශ්‍රිත ව සුවිශේෂී වාරි පද්ධයක් සහ ඒ හා බැඳුණු වාරි සංස්කෘතියක් ගොඩනැගී ඇත.

පාඬිග්ගම වාපී සංස්කෘතියේ පුරුෂාර්ථයන් වඩාත් පෝෂණය වීමට පුල්ලෙයාර් දේව සංකල්පය හේතු වී ඇත. අස්වැන්න ගෙට ගැනීමට ප්‍රථම ව පාඬිග්ගම ගම්මානයේ ප්‍රධාන වැව් සතර (මහ වැව, කුඩා වැව, ඉඳිගහ වැව සහ තල්ගහ වැව) ආශ්‍රිත සංහිඳ අසල පුල්ලෙයාර් දෙවියන්ට පුද පූජා පැවැත්වේ. එහි දී 'මඬේ දීම' නමැති පූජා විධිය (මඬේ දීම යනු පුල්ලෙයාර් දෙවියන් සඳහා කිරිබතක් පිළියෙල කිරීමකි. මඬේ දීම අවසානයේ පිළියෙල කළ කිරිබත රැස් ව සිටින පිරිස බෙදා හදාගෙන අනුභව කරති.) පුල්ලෙයාර් දෙවියන් උදෙසා සිදු කෙරේ. මේ කාර්යයේ දී වැව් සතරට අදාළ වැව් විදානේවරු ප්‍රමුඛ ව කටයුතු කරති. මහවැවේ මඬේ දීමේ දී මහවැවේ විදානේ මුතුබණ්ඩා මහතා ප්‍රමුඛ ව කටයුතු කරයි. මේ ආකාරයට පුල්ලෙයාර් දෙවියන් උදෙසා පුද පූජා කිරීමෙන් පාඬිග්ගම ගම්මානයේ සියලු ම රෝග පීඩා දුරු වීම ද අපේක්ෂා කෙරේ. මේ ආකාරයට පාඬිග්ගම වාපී සංස්කෘතිය පෝෂණය කිරීමට පුල්ලෙයාර් දේව සංකල්පය හේතු වී ඇත. පර්යේෂණ අරමුණේ දක්වා ඇති පරිදි අතීත වන්නි වැදි සමාජයේ ඇදහිලි විශ්වාස ප්‍රතිනිර්මාණය කිරීමට ද පුල්ලෙයාර් දේව වන්දනය ද ඉවහල් කරගත හැකි ය.

පාඬිග්ගම පුල්ලෙයාර් වන්දනය ඇසුරින් තවත් වැදගත් කරුණක් පෙන්වා දිය හැකි ය. එනම් පුල්ලෙයාර් වන්දනාව හේතුවෙන් වන්නි වැදි ගම්මානවල මෙන් ම නුවර කලාවියේ ආගමික සහනශීලී බවක් ගොඩනැඟී ඇති බවයි. වන්නි වැදි ගම්මානවල බහුතර ජන පිරිස සිංහල ජාතිකයන් වුව ද ඔවුහු පුල්ලෙයාර් වන්දනය බහුල වශයෙන් සිදු කරති. මේ පිළිබඳ විමසීමේ දී තවත් වැදගත් කරුණක් සඳහන් කළ යුතු ය. එනම් ඇතැම් ජනප්‍රවාදවලට අනුව පුල්ලෙයාර් දෙවියෝ බෞද්ධයෙකි. පුල්ලෙයාර් දෙවියන් ජීවමාන බුදුන් වහනසේගෙන් ධර්මය අසා සම්‍යක් දෘෂ්ටික දෙවි කෙනෙකු බවට පත් වූ බව ජනප්‍රවාදවල දැක්වේ (පඤ්ඤාලෝක හිමි, 2013: 124-134). පුරාණෝක්ති අනුව පුල්ලෙයාර් දෙවියන් සඳහා හින්දු මෙන් ම බෞද්ධ ආභාසයක් ද පවතින බව මින් පැහැදිලි වේ. මේ කාරණය ද ආගමික සහනශීලී බව ඇති වීමට ඉවහල් වේ.

මේ ආකාරයට පුල්ලෙයාර් වන්දනය නමැති ඇදහිල්ල පාඬිග්ගම ජන ජීවිතයට සුබදායී බලපෑමක් සිදු කර ඇති බව පෙනී යයි. පාඬිග්ගම ආශ්‍රිත ව සංස්කෘතීන් කිහිපයක පෝෂණය සඳහා තත් දේව සංකල්පය හේතු වී ඇත.

## නිගමන (Conclusions)

මෙම පර්යේෂණයේ දී අනාවරණය කර ගත් දත්ත විශ්ලේෂණය කර නිගමනවලට එළඹීම මෙම කොටසේ දී සිදු කෙරේ. ඒ අනුව පර්යේෂණයෙන් එළඹිය හැකි ප්‍රධාන ම නිගමනය වන්නේ, පාඬිග්ගම ඇදහිලි විශ්වාස මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කිරීමට ප්‍රබල වශයෙන් ඉවහල් කර ගත හැකි බවයි. එම නිගමනය සඳහා එළඹුණු ආකාරය ප්‍රතිඵල සහ සාකච්ඡා කොටසේ දී කරුණු සහිත ව දක්වා

ඇත. මානවවංශ පුරාවිද්‍යාවෙන් සිදු කෙරෙන්නේ අතීත මානව සමාජය පිළිබඳ අනාවරණය කර ගැනීමයි. ඒ අනුව ඇදහිලි විශ්වාස පාදක කරගෙන පාඩිග්ගම වන්නි වැදි ජනතාවගේ අතීත සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කිරීමට මෙම පර්යේෂණය ඔස්සේ හැකි විය. එමෙන් ම පාඩිග්ගම ගම්මානය නියැදියක් ලෙස ගෙන ඉන් ලැබෙන මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන ඔස්සේ සමස්ත අතීත වන්නි වැදි සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කළ හැකි ය. ඉන් වන්නි වැදි සංස්කෘතිය පිළිබඳ මේ වන විට සොයා පාදා ගෙන ඇති කරුණු කාරණා යාවත්කාලීන කළ හැකි වනු ඇත. මෙහි දී වර්තමානයේ පාඩිග්ගම පවතින ඇදහිලි විශ්වාසයක් පිළිබඳ **මානවවංශ විද්‍යා උදාහරණ තර්කන ක්‍රියාවලිය (Ethnographic analogy)** යොදා ගෙන එහි අතීත ස්වරූපය පිළිබඳ උපකල්පන ඉදිරිපත් කළ හැකි ය. එනම් වර්තමානයේ පවතින ඇදහිලි විශ්වාසයේ ස්වරූපය, එහි ක්‍රියාකාරීත්වය, ඒ හා බැඳුණු චාරිත්‍ර ආදිය යොදා ගෙන උක්ත ඇදහිලි විශ්වාසය අතීතයේ ද මේ ආකාරයට පවතින්නට ඇතැයි උපකල්පනය කිරීමයි. ඒ අනුව පාඩිග්ගම ඇදහිලි විශ්වාස පාදක කරගෙන අතීත වන්නි වැදි සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කළ හැකි ය. ඒ සඳහා මානවවංශ පුරාවිද්‍යාත්මක සන්දර්භය භාවිතයට ගැනීම සිදු විය.

පර්යේෂණයේ දී එළඹිය හැකි අනෙක් වැදගත් නිගමනය වන්නේ, දිවයිනේ මහා වැදි සංස්කෘතිය සහ අවශේෂ වැදි සංස්කෘති අතර ඉතා කිට්ටු සාම්‍යයක් පවතින බවයි. තව ද පාඩිග්ගම ඇතුළු වන්නි වැදි ප්‍රජාව දඹාන ආශ්‍රිත මහා වැදි සංස්කෘතියට අයත් උප වැදි සංස්කෘතියක් බව නිගමනය කළ හැකි ය. එසේ නිගමනය කිරීමට පාඩිග්ගම ඇදහිලි විශ්වාසවලින් විශාල පිටිවහලක් ලැබේ. වැද්දා කන්දට දානය දීමේ චාරිත්‍රය සහ දඹාන ඇතුළු මහා වැදි සංස්කෘතියේ නෑ යකුන් පිදීම අතර කිට්ටු සාම්‍යයක් පවතින බව ප්‍රතිඵල සහ සාකච්ඡා කොටසේ දී සඳහන් කර තිබේ. එමෙන් ම එම කරුණ පදනම් කරගෙන ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලැත්තන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවෙන් ද වටිනා කරුණු අනාවරණය කර ගත හැකි විය. පර්යේෂණයේ දී මහා වැදි සංස්කෘතිය සහ පාඩිග්ගම වන්නි වැදි සංස්කෘතිය අතර ඇති සාම්‍ය අධ්‍යයනය කිරීමට පෙලඹෙන්නේ ද වැද්දා කන්දට දානය දීමේ චාරිත්‍රය පෙරදැරි කරගෙනයි. ඒ ඔස්සේ දඹානේ සංස්කෘතිය සමඟ සංසන්දනාත්මක අධ්‍යයන සිදු කිරීමෙන් අදාළ නිගමනය වෙත එළඹීමේ අවකාශය ලැබිණි. ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලැත්තන් ප්‍රකාශ කළ පරිදි දිවයින පුරා ව්‍යාප්ත වී ඇති ආදිවාසී ප්‍රජාව අතර සාම්‍යයන් මෙන් ම විෂමතා ද පවතී (සම්මුඛ සාකච්ඡා: ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලැත්තන් සමඟ පුෂ්ප කුමාර, 2022.02.03). එහෙත් මේ සැම ජන කොට්ඨාසයක් ම 'වැදි' යන පොදු කුලකයට අයත් වෙති. ඒ අනුව දඹානේ මහා වැදි සංස්කෘතියෙන් බිඳී ආ සංස්කෘතියක් පාඩිග්ගම පවතින බව පෙනී යයි. එම නිගමනය වෙත එළඹීම සඳහා පාඩිග්ගම ඇදහිලි විශ්වාස විශාල පිටිවහලක් විය. එමෙන් ම පර්යේෂණ ගැටලුව සනාථ කිරීම සඳහා ද මෙය යොදා ගත හැකි ය. එනම් වැද්දා කන්දට දානය දීම නමැති ඇදහිල්ල මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කිරීමට ඉවහල් වන බවයි.

මේ සමඟ එළඹිය හැකි අනෙක් නිගමනය වන්නේ, පාඬිග්ගම ඇදහිලි විශ්වාසවල පවතින ස්වාධීනත්වයි. පාඬිග්ගම ඇදහිලි විශ්වාසවල පමණක් නො ව භාෂාව, කුල ක්‍රමය, කෘෂි ආර්ථිකය සහ සමාජ සිරිත් විරිත් ආදි සෑම අංශයක ම පාඬිග්ගමට අනන්‍ය ලක්ෂණ පවතී. දඹානේ මහා වැදි සංස්කෘතිය, වෙනත් වන්නි වැදි ගම්මාන සහ නුවර කලාවියේ ප්‍රාදේශිකී ලක්ෂණවල ආභාසය ලැබුණ ද පාඬිග්ගමට ස්වීය අනන්‍යතාවක් පවතී. මෙම අනන්‍යතාව ඇති වීමට පාඬිග්ගම හුදෙකලා බව ද හේතු වී ඇත. කුල ක්‍රමය හේතුවෙන් පාඬිග්ගම ප්‍රජාව මහා සංස්කෘතියෙන් තරමක් හුදෙකලාව ජීවත් වූහ. මේ හේතුවෙන් පාඬිග්ගම සංස්කෘතියේ ස්වීය, අනන්‍ය ලක්ෂණ අන්තර්ගත වේ. නිදසුනක් ලෙස දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය වෙනත් වන්නි වැදි ගම්මානවල පැවතිය ද පාඬිග්ගම ශාන්තිකර්මය සුවිශේෂ වේ. ඒ පිළිබඳ ප්‍රතිඵල සහ සාකච්ඡා කොටසේ දී දීර්ඝ ව පැහැදිලි කර ඇත. එමතු නො ව වැද්දා කන්දට දානය දීමේ චාරිත්‍රය ආශ්‍රිත ව ද පාඬිග්ගමට අනන්‍ය ලක්ෂණ පවතී. විශේෂයෙන් ම වැද්දා කන්ද ආශ්‍රිත ව දඩයම ඇතුළු සංස්කෘතීන් කිහිපයක් පැවතී තිබේ. මේ ආකාරයට වෙනත් සංස්කෘතීන්ගේ ආභාසය ලැබුණ ද පාඬිග්ගම ඇදහිලි විශ්වාසවල ඊට ම ආවේණික ස්වීය ලක්ෂණ විශද වේ.

එමෙන් ම පාඬිග්ගම ඇදහිලි විශ්වාස පාදක කරගනිමින් එළඹිය හැකි අනෙක් නිගමනය වන්නේ අස්පර්ශනීය උරුමයන් පිළිබඳ නවමු සංවාදයක් ගොඩනැගිය හැකිය බවයි. පර්යේෂණයේ දී සාකච්ඡා කළ සියලු ම ඇදහිලි විශ්වාස ආශ්‍රිත ව අස්පර්ශනීය උරුම පවතී. උරුම සන්දර්භයේ දී ප්‍රබල අධිකාරියක් ගොඩනගාගෙන සිටින්නේ, ස්පර්ශනීය උරුමයි. එබැවින් අස්පර්ශනීය උරුමයන් පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වේ. සාකච්ඡා කොටසේ දී දක්වා ඇති පරිදි ශාන්තිකර්ම ආශ්‍රිත කවි, ස්තෝත්‍ර ආදිය අස්පර්ශනීය උරුමයන් ලෙස ආරක්ෂා කළ යුතු ය. එමෙන් ම ඉතා ම වැදගත් කරුණක් මෙහි දී සඳහන් කළ යුතු ය. එනම් දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ අන්තර්ගත දෘෂ්ටිවාද (Ideology) සහ මනෝචිකිත්සමය ස්වභාවය (Psychological and Therapeutic Ritual) අස්පර්ශනීය උරුමයන් ලෙස ඉහළ වැදගත්කමක් උසුලයි. ඒ අනුව පාඬිග්ගම ඇදහිලි විශ්වාස පදනම් කරගෙන උරුම සන්දර්භයේ පවතින අස්පර්ශනීය උරුමයන් පිළිබඳ සාකච්ඡාව අභිවර්ධනය කළ හැකි ය.

මේ අනුව ප්‍රතිඵල සහ සාකච්ඡා කොටසේ දී දක්වා ඇති දත්ත මත පදනම් ව මෙම සියලු නිගමන වෙත එළඹී ඇත. පර්යේෂණ ගැටලුවේ සඳහන් වන ආකාරයට මානවවංශ පුරාවිද්‍යාත්මක අර්ථකථන සඳහා පාඬිග්ගම ඇදහිලි විශ්වාස ඉවහල් කර ගත හැකි බව තහවුරු වේ. එසේ ඉවහල් කර ගත් ආකාරය ප්‍රතිඵල සහ සාකච්ඡා කොටසේ දී සනිදර්ශිත ව පෙන්වා දී ඇත. ඒ අනුව මානවවංශ පුරාවිද්‍යාත්මක ව ඉහළ වැදගත්කමක් සහිත සංස්කෘතියක් පාඬිග්ගම ඇදහිලි විශ්වාසවල ගැබ් ව ඇති බව තහවුරු වේ.

වගුව සටහන් 02

| **පාඬිග්ගම සංස්කෘතිකාංගය** | **දඹාන ආශ්‍රිත සංස්කෘතිකාංගය** | **පාඬිග්ගම අනන්‍යතාව** |
|---|---|---|
| **වැද්දා කන්දට දානය පිරිනැමීම.** | කන්දෙ යකා ඇදහීම (නෑ යකුන් පිදීම) | වැද්දා කන්ද ආශ්‍රිත ව මළවුන් ඇදහීමට අමතර ව අවශේෂ සංස්කෘතිකාංග ගොඩනැගීම |
| **පාඬිග්ගම භාෂාව** | දඹානේ වැදි භාෂාව | ස්ථානීය විශේෂත්වය අනුව පාඬිග්ගමට අනන්‍ය වූ භාෂාවක් ගොඩනැඟී තිබීම |

වගු සටහන් 03

| **පාඬිග්ගම සංස්කෘතිකාංගය** | **දඹානේ සංස්කෘතිකාංගය** | **සමතා** | • **විෂමතා** |
|---|---|---|---|
| **වැද්දා කන්දට දානය දීම** | කන්දෙ යකා ඇදහීම (නෑ යකුන් පිදීම) | • මළවුන් පිදීම<br>• දානමය පිදීම් සිදු කිරීම | • පාඬිග්ගම වැද්දා කන්ද ආශ්‍රිත ව මළවුන් පිදීමට අමතරව දඩයම සහ අවශේෂ සංස්කෘතියක් ගොඩනැඟී තිබීම<br>• වැද්දා කන්ද බුදුදහම සමඟ බද්ධ ව පැවතීම |

## නිර්දේශ (Recommendations)

මෙම පර්යේෂණයේ දී ලැබුණු දත්ත සහ විශ්ලේෂණ අනුව නිර්දේශ කිහිපයක් ලබා දිය හැකි ය. මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් පාඬිග්ගම ගම්මානයේ ඇදහිලි විශ්වාස මතු නො ව ගම්මානයේ සමස්ත වටිනාකම් මතු පරපුරට ආරක්ෂා කර තැබීමට හැකියාව ලැබේ. එම නිර්දේශ පහත පරිදි දැක්විය හැකි ය.

- ❖ **පාඬිග්ගම වන්නි වැදි ගම්මානයේ ස්පර්ශනීය උරුමය මෙන් ම අස්පර්ශනීය උරුමය විධිමත් ආකාරයට වාර්තා කර තැබීම.**
- ❖ **විශේෂයෙන් අස්පර්ශනීය උරුමය නිවැරදි ව හඳුනා ගැනීම සහ ඒවා නිවැරදි ව අර්ථකථනය කිරීම.**

- **පාඬිග්ගම ගම්මානයේ ශාන්තිකර්මවල අන්තර්ගත කවි, ශ්ලෝක ආදිය නිවැරදි ව වාර්තා කිරීම සහ පටිගත කර ගැනීම.**
- **වන්නි වැදි ජනතාවගේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමට පාඬිග්ගම සාධක යොදා ගැනීම.**
- **මානවවංශ පුරාවිද්‍යාත්මක න්‍යායන් ඇසුරින් සාධනීය පුරාවිද්‍යාත්මක අර්ථකථන සිදු කිරීම.**
- **පාඬිග්ගම දේව ඇදහිලිවල සුවිශේෂී අනන්‍යතා හඳුනා ගැනීම**

## ස්තුතිය

**පාඬිග්ගම වන්නි වැදි ගම්මානය ආශ්‍රිත ව පවතින ඇදහිලි විශ්වාස පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්** මැයෙන් සිදු කළ මෙම පර්යේෂණයේ දී වටිනා උපදෙස් ලබා දුන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය සන්ධ්‍යා කුමාරි නවරත්න මැණිකේ මහත්මියට ගෞරව සම්ප්‍රයුක්ත ස්තුතිය පළ කරමි. එමෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනවල දී මා වෙත නොමසුරු ව උපකාර කළ පාඬිග්ගම ගමමානයේ ග්‍රාම නිලධාරීතුමිය ඇතුළු පාඬිග්ගම ගම් වැසියන් ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

## ඇමුණුම්

**ඡායාරූප**



ඡායාරූපය 01: දේව අනාභරණ කට්ටලයට අයත් සීරි කඩුව

**(ඡායාරූපකරණය: ආර්.ඩී.ධනුෂ්ක පුෂ්ප කුමාර)**



ඡායාරූපය 02: දේව අනාභරණ කට්ටලයට අයත් කාල ජමජාරිය



ඡායාරූපය 03: දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ දී භාවිත කරන යෂ්ටිය හෙවත් හෝල් කෝටුව

**(ඡායාරූපකරණය: ආර්.ඩී.ධනුෂ්ක පුෂ්ප කුමාර)**



ඡායාරූපය 04 (දේව ආභරණ කට්ටලයට අයත් නයි හත්ත)



ඡායාරූපය 05 (පාඬිග්ගම පුල්ලෙයාර් වන්දනය)

**(ඡායාරූපකරණය: ආර්.ඩී.ධනුෂ්ක පුෂ්ප කුමාර)**



ඡායාරූපය 06 (පාඬිග්ගම පුල්ලෙයාර් වන්දනය)



ඡායාරූපය 07 (මහවැවේ විදානේ මුතුබණ්ඩා මහතා සමඟ පැවැත්වුණු සම්මුඛ සාකච්ඡාව)

**(ඡායාරූපකරණය: ආර්.ඩී.ධනුෂ්ක පුෂ්ප කුමාර)**



ඡායාරූපය 08 (ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලැත්තන් සමඟ පැවැත්වුණු සම්මුඛ සාකච්ඡාව)

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි නාමාවලිය

### ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය

*ඌනපූරණ සහිතො මහාවංසො.* (1959). (සංස්.) ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

*පූජාවලිය.* (1997). (සංස්.) ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

### ද්වීතියික සාහිත්‍ය මූලාශ්‍රය

ඔබේසේකර, ගණනාථ. (2018). “යටත්විජිත ඉතිහාසය ලේඛන හා වැද්දා පිළිබඳ ප්‍රාථමිකතාවාදය: නුවර යුගයේ ලේඛන පිළිබඳ විසම්මුතික කියැවීමක්” එල්.ඩී.සරත් විතාරණ, චින්තක රණසිංහ (සංස්.) *ගණනාථගේ රචනා.* 236-274 පිටුව, සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය.

චන්ද්‍රරත්න, ආර්.එම්.එම්. (2009). "මානවවංශ පුරාවිද්‍යා අධ්‍යයන ක්‍රමවේදයන් භාවිතයෙන් පැරණි සංස්කෘතීන් ප්‍රතිනිර්මාණය" ඒ.එස්.ටී. රාජපක්ෂ, ඉෂංක මල්සිරි (සංස්.) *විකල්ප පුරාතත්ත්ව*. 35-40 පිටුව, පේරාදෙණිය: පේරාදෙණිය විශ්වවිද්‍යාලය පුරාවිද්‍යා සංගමය.

ජයම්පත්, එස්.ඒ. (2009). "මානවවිද්‍යා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ විධික්‍රම" ප්‍රශාන්ත ගුණවර්ධන, ගාමිණී අධිකාරි (සංස්). මානව *විද්‍යාව හැඳින්වීම*. 56-74පිටුව, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර. (2003). *මුට්ටි මංගල්ලයේ වගතුග*. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර. (2005). *වැව හා සංස්කෘතිය*. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දැරණියගල, ශිරාන්. (1991). *ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය*. කැලණිය: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

නවරත්න මැණිකේ, සන්ධ්‍යා කුමාරි. (2016). *ශ්‍රී ලංකාවේ වැදි ජනයා පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්*. (*දඹාන, රතුගල, හෙන්නානිගල හා පොල්ලෙබැද්ද පාරම්පරික වැදිගම්මාන ඇසුරින්*) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ ශාස්ත්‍රීය නිබන්ධය (අප්‍රකාශිතයි.)

පඤ්ඤාලෝක හිමි, කොණකුඹුක්වැවේ (2013). "පුල්ලයාර් දෙවියන් හා බැඳුණු රජරට පූජා විධි" රස්නකවැවේ සංසරතන හිමි (සංස්). *ඥානෝද්දීපනී*. 124-134පිටුව, අනුරාධපුරය: ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ධර්ම පුස්තකාලය.

පුෂ්ප කුමාර, ආර්.ඩී.ඩී. .(2022)*පාඬිග්ගම වන්නි වැදි ගම්මානය ආශ්‍රිත ව මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්* . පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා විශේෂ උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ ශාස්ත්‍රීය නිබන්ධය (අප්‍රකාශිතයි.)

ප්‍රේමචන්ද්‍ර, සුමුදු සහ බණ්ඩාර, චන්ද්‍රතිලක. (2019). *බණ්ඩාරදූවේ වැද්දෝ*. කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

බෝහිංගමුව, බී.එම්.එම්.ඩබ්. සහ සිරිවර්ධන, අශෝකා ශ්‍රියානි. (2010). "වන්නි මිනිස්සු පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්" ප්‍රශාන්ත ගුණවර්ධන, ගාමිණී අධිකාරි (සංස්.) *වැදි ජන උරුමය*. 337-357 පිටුව, බත්තරමුල්ල: නෙප්චූන් ප්‍රකාශන.

මෙලාති, සල්ඩින්. (2009). "ශ්‍රී ලංකාවේ මානවවිද්‍යාවේ න්‍යායික පසුබිම" ප්‍රිශාන්ත ගුණවර්ධන, ගාමිණී අධිකාරි (සංස්.) *මානවවිද්‍යාව හැඳින්වීම*. 39-51 පිටුව, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලීච්, ඊ.ආර්. (2003). *පුල්එළිය*. (අනුවාදය) එම්.ඩී.එම්. සෙනෙවිරත්න, කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

සෙලිග්මාන්, සී. ජී. (2009). *වැද්දෝ* (The Veddas සිංහල පරිවර්තනය- චන්ද්‍ර ශ්‍රී රණසිංහ), කොළඹ: ෆාස්ට් පබ්ලිෂින්.

සෙනෙවිරත්න, අනුරාධ. (2009). *පුරාණ සිංහල වාරි සංස්කෘතිය*. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Brow, J. (1978). *Vedda villages of Anuradhapura: The Historical Anthropology of a Community in Sri Lanka.* London: University of Washinton Press.

Deraniyagala, S.U. (1992). ***The prehistory of Sri Lanka An Ecological Perspective.*** Colombo: Department of Archaeology.

Pushpa Kumara, R.D.D. 2021, *A Investigative Study about the Folklore Traditions Associated with Padiggama Village* (In Sinhala), 3rd International Conference on Intangible Cultural Heritage (ICICH 2021), Department of Anthropology, Univerity of Sri Jayewardenepura, Sri Lanka, pp.38

Convention for the Safeguarding of the Intangible Cultural Heritage, 2003.

**සම්මුඛ සාකච්ඡා**

ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලැත්තන් සමග 2022.02.03 දඹානේ දී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව

❖ කදිරාතා මහතා (2020-02-18) (පළමු සාකච්ඡාව)
ලිපිනය: පාඩිග්ගම, ඇටවීරගොල්ලෑව. වයස: 87

- කදිරාතා මහතා (2020-07-24) (දෙවන සාකච්ඡාව)
- කදිරාතා මහතා (2021-10-16) (තෙවන සාකච්ඡාව)
- කදිරාතා මහතා (2021-10-17) (සිව්වන සාකච්ඡාව)

❖ කන්දාතගේ නන්දසේන මහතා (2020-02-18) (පළමු සාකච්ඡාව)
ලිපිනය: පාඩිග්ගම, ඇටවීරගොල්ලෑව. වයස: 70

- කන්දාතගේ නන්දසේන මහතා (2021-10-16) (පළමුවන සාකච්ඡාව)
- කන්දාතගේ නන්දසේන මහතා (2021-10-17) (දෙවන සාකච්ඡාව)

❖ මුතුබණ්ඩා මහතා
ලිපිනය: පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. වයස: 72

- මුතුබණ්ඩා මහතා (2020-02-18) (පළමු සාකච්ඡාව)
- මුතුබණ්ඩා මහතා (2022-01-30) (දෙවන සාකච්ඡාව)